**කල්පිටිය ප්‍රාදේශීය සභාව - 2023**
**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කල්පිටිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කල්පිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින රු.4,602,544ක් වූ නොරොච්චෝල ආර්ථික මධ්‍යස්ථානයේ වැසිකිළි පද්ධතියේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ජ’නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්‍ා

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව තැන්පත් ශේෂය රු.38,479,730ක් වූ අතර උප ලේඛන අනුව රු.38,357,418ක් වූයෙන් රු.122,312ක වෙනසක් විය. | ඉදිරියේ දී මෙම කටයුතු නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | වෙනසට හේතු පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| | (i) | මුදල් රෙගුලාසි 371(ඇ) | අවස්ථා 19 කදී වටිනාකම රු.229,658ක් වූ අත්තිකාරම් | ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | අදාළ කාර්යය නිම කළ විගස පියවා නොතිබුණි. | | |
| | (ii) | මුදල් රෙගුලාසි 571(2) | වසර 02ක් ඉක්ම වූ රු.1,098,733ක තැන්පත් 15ක් සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තැන්පත් ආදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත 129(2) (ආ) සහ (ඊ) වගන්ති | | ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු බදු කුලී, කඩ කුලී, උසාවි දඩ, මුද්දර ගාස්තු විධිමත් පරිදි ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | බදුකුලී සහ කඩකුලී හිඟ මුදල ගෙවන ලෙස දන්වා ලිපි යවා ඇති අතර, අගෝස්තු සිට දෙසැම්බර් දක්වා වූ උසාවි දඩ මුදල් ගෙන්වා ගැනීම සඳහා ආණ්ඩුකාරවරයා වෙත ඉල්ලීම් කර ලිපි යවා ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | | |
| | (i) | අංක 33 රීතිය | වරිපනම් බදු ගෙවීම පැහැර හරින පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුවක් සහ දේපළ තහනම් කිරීමේ වරෙන්තු එක් එක් කාර්තුව අවසානයේදී පිළියෙල කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | නීති රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) | අංක 65 රීතිය | ගෙවීම් සඳහා ඉඩදී තිබෙන කාල සීමාව අවසානයේදී ගෙවීම පැහැර හරින තැනැත්තන්ගේ නාම ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | නාම ලේඛනයක් පිළියෙල කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | නීති රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.40,011,831ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.47,993,968ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 5,265 | 4,545 | 2,483 | 14,593 | 5,383 | 5,161 | 3,310 | 16,668 |
| කුලී | 18,217 | 16,480 | 12,930 | 11,012 | 15,819 | 15,532 | 15,536 | 9,034 |
| බලපත්‍ර ගාස්තු | 3,711 | 2,638 | 2,638 | - | 3,745 | 2,588 | 2,588 | 35 |
| වෙනත් ආදායම් | 8,225 | 4,336 | 4,336 | - | 6,010 | 5,648 | 5,648 | - |
| එකතුව | 35,418 | 27,999 | 22,387 | 25,605 | 30,957 | 28,929 | 27,082 | 25,737 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු.13,090,328ක්, අක්කර බදු රු.1,067,835ක්, ජල බදු රු.338,057ක් සහ කුලී රු.3,780,691ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු මුද්දර ගාස්තු රු.51,913,770ක් හා සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු උසාවි දඩ රු.4,999,850ක් විය. | උසාවි දඩ මුදල් ලබා ගැනීම සඳහා ආණ්ඩුකාරවරයා වෙත ඉල්ලීම් කර ලිපියවා ඇති අතර මුද්දර ගාස්තු උප ලේඛන සකස්කර පළාත් ආදායම් කාර්යාලය වෙත භාර දී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත හිමියන් 18 දෙනෙකු පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබූ අතර ඒ හේතුවෙන් රු.57,500ක ආදායමක් අහිමි වී තිබුණි. | කර්මාන්ත හිමියන් වෙත ලිපි ලබා දී ඇති බව. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශය නොමැතිව සභාව සතු කැබ් රථය රු.1,650,000ක මුදලකට අළුත්වැඩියාව වෙනුවෙන් ගිවිසුමකට එළඹ තිබුණි. | ඇස්තමේන්තුව ගරු මහා සභාවේ අනුමත කර තිබූ බැවින්, ගිවිසුම් ගත වී කැබ් රථය අළුත්වැඩියා කටයුතු සිදු කර ඇති බව. | යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශය ලබාගත යුතුය. |
| (ඇ) | සභාබල ප්‍රදේශයට අයත් දියුණු ප්‍රදේශ හඳුනාගෙන නව වරිපනම් තක්සේරුවක් සිදු කර ගාස්තු අයකර ආදායම් වැඩි කර ගැනීමට සභා බලධාරීන් කටයුතු කර නොතිබුණි. | ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කරන බව. | වරිපනම් තක්සේරුවක් සිදු කර ආදායම් අයකරගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ ගිණුම්වල වටිනාකම රු.13,270,926ක් වූ අතර ඒ තුළ අවුරුදු 03ත් අවුරුදු 05ත් අතර වටිනාකම රු.10,180,886ක් විය. | ඉදිරියේ දී අය කිරිමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු.26,827,596ක් වූ අතර ඉන් අවුරුදු 05කට වැඩි රු.6,768,355ක් විය. | ඉදිරියේ දී අය කිරිමට කටයුතු කරන බව. | ගෙවිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඩ කාමර 59ක ගිවිසුම් කාලය ඉකුත් වී තිබූ අතර යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් අලුත් කිරිමට කටයුතු කරන බව. | හැකි ඉක්මනින් ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 වර්ෂය සඳහා වාහන ගාල් කිරීමේ ආදායම් රැස් කිරීම සඳහා පුද්ගලයෙකුට රු.777,689ක මුදලකට ගිවිසුම් අත්සන් කිරීමෙන් තොරව ලබාදී තිබුණි. | ටෙන්ඩර් මුදල එකවර ගෙවා ඇති බව. | ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු කොඩි කණු 464න් කොඩි කණු 244ක් අස්ථාන ගතවී තිබුණි. | වටිනාකම අය කර ගැනීමට කටයුතු කරන බව. | වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් භුක්ති විදිනු ලබන වෙළඳ සංකීර්ණය, සති පොල, පොදු ක්‍රීඩා පිටි, ළමා උද්‍යාන, පෙර පාසල්, පුස්තකාල, සුසාන භූමි, බස් නැවතුම්පොල පොදු වැසිකිළි හා | ඉදිරියේදී එය කඩිනමින් සිදු කරන බව. | අදාළ දේපළ පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

ප්‍රජා ශාලා ඇතුළු වත්කම් 69ක් පවරාගෙන නොතිබුණි.

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වන්නිමුන්දලම කාදර් මයාගේ නිවස පාර කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය සඳහා 2023 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ රු.995,023ක ඇස්තමේන්තු වටිනාකමකින් ඉටු කරන ලද කර්මාන්තයේ කොන්ක්‍රීට් ශක්තිය පරීක්ෂා කිරීම සඳහා Cube Test සඳහා දින 07කින් Cube ඉදිරිපත් කර තිබුණි. එමඟින් නිවැරදි වාර්තාවක් නොලැබෙන අතරම Core Test ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන් උනන්දු කිරීමක්ද කර නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | නිවැරදි කාලයකදී නිවැරදි වාර්තා ලබා ගෙන ගෙවීම් කළ යුතු වේ. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ ද්වීතියික තනතුරු 16ක්ද ප්‍රාථමික තනතුරු 12ක්ද පුරප්පාඩු වී තිබුණි. | පවතින සේවක පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | සභාවට අවශ්‍ය සේවක සංඛ්‍යාව ප්‍රමාණය නිවැරදිව හඳුනා ගෙන අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.6 වාහන පද්ධති කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව භාවිතයට ගන්නා ලද වාහන 08ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීම සඳහා අදාළ ඉල්ලුම් පත්‍ර මෝටර් රථ ලියාපදිංචි කිරීමේ කොමසාරිස් කාර් යාලය වෙත භාර දී ඇති බව. | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම හා එහි කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා සහාය වන ක්‍රියාවලියක් වු නමුත් සභාවේ අභ්‍යන්තර විගණනය විසින් ආදායම්, සේවක ණය, නිවාඩු හා | නිසි පරිදි අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරන බව. | වැදගත් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විගණනය සැලසුම් කර කටයුතු සිදු කළ යුතුය. |

ගොඩනැගිලි අයදුම්පත් පරීක්ෂා කිරීම් පිළිබඳව පමණක් අවධානය යොමු කර තිබුණි.

## 4.2 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල අයවැය ඇස්තමේන්තු මඟින් වැය විෂයයන් 09කට අදාළව සලසා තිබුණු රු.5,182,100ක සම්පූර්ණ ප්‍රතිපාදනයම අදාළ අයවැයගත කාර්යයන් ළඟා කර ගැනීම සඳහා භාවිතා කර නොතිබුණි. | වැඩසටහන් සහ කාර්යයන් නියමිත කාලය තුල ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවයක් පැවතුන බව. | අයවැය ගත ඉලක්ක සපුරා ගැනීමට හැකි අයුරින් මෙහෙයුම් කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | තවද සමාලෝචිත වර්ෂයට අදාළව වැය විෂයයන් 12ක් සඳහා රු.8,135,800ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් වැයකර තිබුණේ සියයට 50කටත් අඩු ප්‍රමාණයකි. | වැඩසටහන් සහ කාර්යයන් නියමිත කාලය තුල ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවයක් පැවතුන බව. | අයවැය ගත ඉලක්ක සපුරා ගැනීමට හැකි අයුරින් මෙහෙයුම් කටයුතු සිදු කළ යුතුය. |

## 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ළඟා කරගත යුතු අරමුණු හා ඉලක්ක කරා ළඟා වීම සඳහා සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා තිරසර සංවර්ධන අරමුණු 69ක් සඳහා ඉලක්කයන් හඳුනාගෙන තිබූ අතර අරමුණු 10ක් පමණක් ඉටුකර තිබුණි. | කාර්යමණ්ඩල ඌනතාව හේතුවෙන් ඉලක්ක සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | අරමුණු හා ඉලක්ක කරා ළඟා වීමට කටයුතු කළ යුතුය. |